63991

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**2567 - දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2020/2021/2022 (2023)**

**01 S**

**(01) බුද්ධ චරිතය**

පැය තුනයි

**අමතර කියවීම් කාලය -මිනිත්තු 10 යි.**

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ. යටත් පිරිසෙයින් එක් කොටසකින් එක් ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) බ්‍රාහ්මණ ධර්මයට අනුව චතුර් ආශ්‍රම ධර්ම නම් කරන්න. (ලකුණු 04 යි)

   (ii) ඒ ඒ ආශ්‍රම ධර්මයෙන් අර්ථවත් කෙරෙන ජීවිතයේ වැදගත් අවස්ථා ලියා දක්වන්න. (ලකුණු 04 යි)

   (iii) බ්‍රාහ්මණ ආගමික ඉගැන්වීම තුළ භාරතීය කාන්තාවට හිමි වූ තත්ත්වය කෙටියෙන් පහදන්න. (ලකුණු 06 යි)

   (iv) බුදුසමය තුළ භාරතීය කාන්තාව ලැබූ ආගමික හා සාමාජික නිදහස උදාහරණ ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

2. (i) බුද්ධකාලීන භාරතයේ ජීවත්වූ ෂට් ශාස්තෘවරුන් අතුරින් නිගණ්ඨනාතපුත්ත හැර වෙනත් හතරදෙනෙකු නම් කරන්න. (ලකුණු 04 යි)

   (ii) නිගණ්ඨනාතපුත්ත ශාස්තෘතුමාගේ ඉගැන්වීමෙහි ඇතුළත් චතුයාම සංවරශීලය ලියා දක්වන්න. (ලකුණු 04 යි)

   (iii) බ්‍රාහ්මණ ධර්මයට එරෙහිව පැන නැගුණු ශ්‍රමණ සම්ප්‍රදාය විසින් ප්‍රතික්ෂේප කරන ලද බ්‍රාහ්මණික ඉගැන්වීම් දෙකක් විචාරයට ලක් කරන්න. (ලකුණු 06 යි)

   (iv) බුද්ධකාලීන භාරතයේ පැවති මහාතිත්ථායතන සූත්‍රයේ සඳහන් දාර්ශනික මතවාද තුන විචාරයට ලක් කරන්න. (ලකුණු 06 යි)

3. (i) බුද්ධකාලීන භාරතයේ ආර්ථික ක්‍රියාවලිය තුළ පැවති නිෂ්පාදන කර්මාන්ත හතරක් නම් කරන්න. (ලකුණු 04 යි)

   (ii) එවක ශාක්‍යවංශික රජවරුන් කෘෂිකර්මාන්තය සමඟ පැවති සබඳතාව ප්‍රකට කරලීමට බෞද්ධ සාහිත්‍යාගත උදාහරණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

   (iii) පැරණි භාරතීය සමාජය තුළ දියුණු වෙළෙඳ ආර්ථිකයක් පැවති බවට සාධක දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

   (iv) බුද්ධකාලීන භාරතයේ ආර්ථික සමෘද්ධිය උදෙසා අනුගමනය කළැයි සැලකෙන ආර්ථික උපායමාර්ග විචාරයට ලක් කරන්න. (ලකුණු 06 යි)

## II කොටස

4. (i) ශාක්‍යයන්ගේ හා කෝලියයන්ගේ අගනගර ගෙනහැර දක්වා එම රාජ පරම්පරා දෙකෙහි ආදි පුරුෂයන් නම් කරන්න. (ලකුණු 04 යි)

   (ii) ශාක්‍යරාජ පරපුරේ සිංහහනු හා කාංචනා යන රජ යුවලට අයත් පුතණුවරුන් සිව්දෙනෙකු ලියා දක්වන්න. (ලකුණු 04 යි)

   (iii) කෝලිය රාජ පරපුරේ ආරම්භය පිළිබඳ පුරාවෘත්තය කෙටියෙන් දක්වා කෝලිය පරපුරේ රජවරුන් ශාක්‍යවංශිකයන් සමඟ ඇතිකරගත් විවාහ ඥාති සබඳතා සඳහන් කරන්න. (ලකුණු 06 යි)

   (iv) ශාක්‍ය හා කෝලිය රාජ පරම්පරා දෙක බෝසත් හා බුදුසිරිත සමඟ සම්බන්ධවන අවස්ථා තුනක් දක්වන්න. (ලකුණු 06 යි)

[ 2 වැනි පිටුව බලන්න.

5. (i) සිද්ධාර්ථ කුමරුගේ නම් තැබීමේ උළෙලට සහභාගි වූ ශාක්‍ය දේශයේ ප්‍රකට පඬිවරුන් සිව්දෙනෙකු නම් කරන්න. (ලකුණු 04 යි)
(ii) සිද්ධාර්ථ බෝසතුන්ට අභිනිෂ්ක්‍රමණය කිරීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(iii) සිදුහත් බෝසත් චරිතය තුළින් ළමා පරපුරට ඉදිරිපත් කෙරෙන මඟපෙන්වීම උදාහරණ තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
(iv) සිද්ධාර්ථ බෝසතාණන්වහන්සේ සත්‍යාවබෝධය පිණිස ගුරුවරුන් සොයා යෑම කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

6. (i) බුදුසසුනේ පළමු ද්වෛවාචික උපාසකවරුන් දෙදෙනා හා පළමු තේවාචික උපාසිකාවන් දෙදෙනා නම් කරන්න. (ලකුණු 04 යි)
(ii) බුදුසසුනේ පැවිදි උපසම්පදාව ලැබූ යසකුලපුත්‍රයාගේ සමීපතම යහළුවන් හතරදෙනා ලියා දක්වන්න. (ලකුණු 04 යි)
(iii) බුදුරදුන් තුන්බෑජටිලයන් දමනය කළ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)
(iv) බුදුසසුනේ පළමු ධර්ම ප්‍රචාරක කණ්ඩායම නම් කර ඔවුන් අමතා බුදුරදුන් සිදු කළ දහම් පණිවුඩය ලියා දක්වන්න. (ලකුණු 06 යි)

## III කොටස

7. (i) ආනන්ද ශාක්‍යකුමරු සමඟ බුදුරදුන් වෙත පැමිණ පැවිදි වූ ශාක්‍ය කුමාරවරුන් හතරදෙනෙකු නම් කරන්න. (ලකුණු 04 යි)
(ii) බුදුරදුන්ගේ කිඹුල්වත්පුර චාරිකාවෙන් සසුනට සැලසුණු ප්‍රයෝජන හතරක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)
(iii) ලිච්ඡවීන්ගේ විශාලාමහනුවර තුන්බිය දුරු කිරීම සඳහා මහාලි ලිච්ඡවී රජු අනුගමනය කළ ක්‍රියාමාර්ග සඳහන් කරන්න. (ලකුණු 06 යි)
(iv) බුදු සසුනේ සීග්‍ර ව්‍යාප්තිය කෙරෙහි සුදත්ත සිටුතුමාගේ ජේතවනාරාම පූජාව ඉවහල් වූ අයුරු සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

8. (i) රෝහිණී නදියෙහි ජලය මුල්කොටගෙන ශාක්‍ය-කෝළිය දෙපාර්ශ්වයේ යුද්ධය සංසිඳවීමට බුදුරදුන් දේශනා කළ ජාතක ධර්ම හතරක් නම් කරන්න. (ලකුණු 04 යි)
(ii) ශාක්‍ය-කෝළිය යුද්ධය සංසිඳවීමට අදාළ පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
එහිදී බුදුරදුන් වෙත පැමිණ පැවිදි වූ පිරිස කොපමණ ද?
ඔවුන් ලැබූ පැවිද්ද හඳුන්වන නාමය කුමක් ද?
ඔවුන්ට දේශනා කළ ප්‍රධාන සූත්‍ර දේශනාව කුමක් ද?
ඔවුන් ලැබූ මග ඵල නුවණ කෙබඳු ද? (ලකුණු 04 යි)
(iii) 'බුදුරදුන්ගේ දෙවැනිවර ලංකාගමනය සිදුවූයේ යුද්ධයක් සංසිඳවීම පිණිස ය.' කාලය, ස්ථානය, නිමිත්ත, යුධ වැදුණු දෙපිරිස හා ඔවුන්ට දේශනා කළ ධර්මය ඇතුළත්ව කෙටි විස්තරයක් සපයන්න. (ලකුණු 06 යි)
(iv) යුධ කෝලාහල සංසිඳවීමෙහි ලා බුදුසමය වර්තමාන ලෝකය වෙත සැපයිය හැකි ධර්මෝපදේශ සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

9. (i) බුදුසසුනේ සිව්වනක් පිරිසට අයත් සැරියුත් මුගලන් දෙනම හැර පැවිදි ශ්‍රාවක ශ්‍රාවිකාවන් සිව්දෙනෙකු නම් කරන්න. (ලකුණු 04 යි)
(ii) ඔබ විසින් නම් කරන ලද ශ්‍රාවක ශ්‍රාවිකාවන් බුදුරදුන්ගෙන් ලබාගත් අගතනතුරු සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(iii) සැරියුත් මුගලන් අගසව් වහන්සේලා දෙනමගේ ශාසනික සේවාව කෙටියෙන් පහදන්න. (ලකුණු 06 යි)
(iv) සද්ධර්මයේ චිරස්ථිතිය උදෙසා ආනන්ද මහරහතන් වහන්සේගේ ශාසනික දායකත්වය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 06 යි)

10. (i) බුදුසසුනේ උන්නතියට දායක වූ කෝසලමල්ලිකාව හැර බුද්ධකාලීන වෙනත් උපාසක-උපාසිකාවන් සිව්දෙනෙකු නම් කරන්න. (ලකුණු 04 යි)
(ii) ඉහත අංක 10 (i) හි ඔබ විසින් නම් කරන ලද උපාසක - උපාසිකාවන් බුදුසසුනේ උන්නතියට ලබාදුන් දායකත්වය වෙන වෙන ම දක්වන්න. (ලකුණු 04 යි)
(iii) සැදැහැති උපාසිකාවක ලෙස කෝසලමල්ලිකා දේවියගේ ශාසනික සේවාව ඇගයීමට ලක් කරන්න. (ලකුණු 06 යි)
(iv) බුදුසසුනේ චිර පැවැත්ම උදෙසා වර්තමාන උපාසක-උපාසිකාවන්ගේ කාර්යභාරය විස්තර කරන්න. (ලකුණු 06 යි)

PAST PAPERS WIKI
Downloaded From Past Papers WiKi * Sri Lanka's Largest Past Papers Library